## සුරාබදු ආඥාපනත

## අංක 1005 දරන සුරාබදු නිවේදනය

## පානීය නොවන ස්ප්‍රීතු ආනයනය සඳහා වූ සුරාබද්ද

කලින් කලට සංශෝධනය කරන පරිදි සුරාබදු ආඥාපනතේ (52 වන අධිකාරය වූ) 32 වන වගන්තිය සමඟ කියවිය යුතු 2, 12, 22 සහ 25 වන වගන්ති යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය මංගල සමරවීර වන මම මෙම නියෝගය මඟින් 2017 නොවැම්බර් 09 දිනැති අංක 2044/33 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශිත සුරාබදු නිවේදන අංක 999 හි සඳහන් රීති, එහි ඡේද අංක 05ට වහාම ඉක්බිතිව පහත සඳහන් ඡේදය ඇතුළත් කිරීමෙන් සහ ඡේද අංක 06 ඡේද අංක 07 ලෙස අංකනය කිරීමෙන් සංශෝධනය කරනු ලබයි.

" 6. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමග ගිවිසුමකට එළඹ ඇති යම් අපනයන අභිමුඛ නිෂ්පාදන සමාගමක් 2017 නොවැම්බර් 09 දිනැති අංක 2044/33 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ සුරාබදු නිවේදන අංක 999 හි දැක්වෙන පළමුවන උප ලේඛනයෙහි සඳහන් අයිතම අමුද්‍රව්‍ය ලෙස භාවිතා කරමින් නිෂ්පාදනය කරනු ලබන මුළු නිෂ්පාදිතයන්ගෙන් සියයට 80 කට නොඅඩු ප්‍රමාණයක් අපනයනය කරනු ලබන්නේ නම් සහ එම අපනයන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් සහතික කරනු ලබන්නේ නම්, එකී අමුද්‍රව්‍ය ආනයනය කිරීම සඳහා වන සුරාබද්ද ඉහත කී අංක 999 දරන සුරාබදු නිවේදනයෙහි සඳහන් ගෙවිය යුතු බද්දෙන් සියයට 10 කි. ”

මංගල සමරවීර,
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය

2017 දෙසැම්බර් මස 19 වැනි දින,
කොළඹ 01,
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ දී ය.